**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 26/99**

මගේ අංකය: II/309ඊ95/20
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
1999 නොවැම්බර් මස 23 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**<u>රජයේ සේවයේ කණිෂ්ඨ ශ්‍රේණිවල තාවකාලික අනියම් හා</u>**
**<u>ආදේශක සේවකයන් ස්ථිර කිරීම</u>**

1999 නොවැම්බර් 01 දිනට දින 180 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර ඇති වැඩ හා හැසිරීම සතුටුදායක, රජයේ සේවයේ කම්කරු ශ්‍රේණිවල, කාර්යාල සේවක සේවයේ සහ රියදුරු සේවයේ, බඳවා ගැනීමේ ශ්‍රේණිවල, තාවකාලික, අනියම් හා ආදේශක සේවකයන්, පහත සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන්නේ නම් 1999 නොවැම්බර් මස 01 දින සිට සිය සේවයේ ස්ථිර කරනු ලැබිය යුතු යයි රජය තීරණය කර ඇත.
.

i. අනුමත ස්ථිර සේවක සංඛ්‍යාවේ පුරප්පාඩුවක් තිබිය යුතුය.

ii. දැනට පුරප්පාඩුව පවතින අනුමත සේවක සංඛ්‍යාවට ඇතුලත් ස්ථිර තනතුරක අඛණ්ඩව සේවය කර තිබිය යුතුය.

iii. අනුමත බඳවා ගැනීමේ පරිපාටියේ දක්වා ඇති අවශ්‍ය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

02. මේ සම්බන්ධයෙන් වහාම පියවර ගතයුතුය. එක් එක් දෙපාර්තුමේන්තුව යටතේ, එසේ ස්ථිර කරන ලද සේවකයන් පිළිබඳ තොරතුරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට ද පිටපත් සහිතව ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා කලයුතුය.

03. අදාල සේවකයන්, ස්ථිර කිරීම සම්බන්ධයෙන් සියළු කටයුතු 1999 දෙසැම්බර් 31 දිනට පෙර අවසන් කලයුතුය.

**මහින්ද බන්දුසේන**
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.